249

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
08 JUN 2001
UNIVERSITY OF KELANIYA

# විනය ශික්ෂා ඇසුරින් ප්‍රකට වන
# බුද්ධ කාලීන භික්ෂුණීන්ගේ අධ්‍යාපන හා ශික්ෂණ
# ක්‍රම පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

ප්‍රවේශ අංකය 249
වර්ග අංකය

ජී.ඩී. කරුණා ජයසිංහ.

ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ
දර්ශනපති උපාධිය
සඳහා
ඉදිරිපත් කරනු ලබන නිබන්ධයයි.

1998

## සාරාංශය

විනය පිටකයේ භික්ෂුණීන්ට අදාළ විනය ශික්ෂා රාශියක් ඇතුළත් ව පවතී. මෙම ශික්ෂාවන් පිළිබඳ සවිස්තර විවරණ විනය අටුවා ටීකාවන් තුළ දක්නට ලැබේ. එම ශික්ෂා විවරණ විමසා බැලීමෙන් පැහැදිලි වන්නේ එහි අවබෝධය හා චරණය යන දෙපක්ෂයට ම සම්බන්ධ වන කරුණු ඇතුළත් වී තිබෙන බවයි. මේ හැරුණු විට ථෙර ථෙරී ගාථා වැනි වෙනත් මූලාශ්‍රයන් ද භික්ෂුණීන්ගේ අධ්‍යාපනයට අදාළ තොරතුරු ද මෙහි විද්‍යමාන වේ. මේ සියලු තොරතුරු ඒකරාශි කොට බුද්ධකාලීන භික්ෂුණීන් විසින් ලබන ලද අධ්‍යාපනයත් ශික්ෂණ ක්‍රමත් පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

වනිතාවගේ අයිතිවාසිකම් පිළිබඳ පෙර නො වූ විරූ ප්‍රබෝධයක් හා උද්යෝගයක් ලොව පුරා පැතිර පැවතීම මෙකල සුභවාදී ලක්ෂණයක් ලෙස දැකිය හැකිය. වනිතාව සම්බන්ධයෙන් විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් පළවන කෘතීන් සුලබ වීම ද වනිතා උරුමයන්හි සාම්ප්‍රදායික සීමා යළි යළිත් විමසීමට ලක් කරයි. විවිධ ආගමික සංස්කෘතීන් හා සම්ප්‍රදායයන් හැඩගැසීමෙහි ලා බලපෑවැත් වූ දෘෂ්ටීන් පිළිබඳ ශාස්ත්‍රීය පර්යේෂණ සිදුවීම ද කාලීන අවශ්‍යතාවකි. භික්ෂුණී ශාසනය පිහිටුවීම පිළිබඳ උනන්දුවක් ඇති මෙවන් යුගයක භික්ෂුණී අධ්‍යාපනය හා ශික්ෂණය පිළිබඳ මෙසේ විමසා බැලීම කාලීන වැදගත්කම තවදුරටත් තිව්‍ර කරයි. මාගේ අවබෝධයට අනුව මෙම ක්ෂේත්‍රය පිළිබඳ විධිමත් අධ්‍යයනයක් ප්‍රමාණවත් අයුරින් සිදු වී නොමැති බැවින් මෙම අධ්‍යයනය බෞද්ධ සංස්කෘතිය විෂය සම්බන්ධයෙන් කෙරෙන ප්‍රදානයක් වන බව මගේ විශ්වාසයයි.

ප්‍රාග් භාරතයේ මූලික අවධියේ කාන්තාවට යම් යම් වරප්‍රසාද ලැබී තිබුණු බවට සාධක බොහෝ ඇත. පුරුෂයන්ට මෙන් ආගමික හා සමාජයීය ඉගැන්වීම් අනුව කාන්තාවට අධ්‍යාපනික, ආගමික හා සාමාජික වශයෙන් නිදහසේ වරප්‍රසාද භුක්ති විඳීමට ඉඩ නොසැලසිණ. පශ්චාත් වෛදික යුගයේ භාරතීය කාන්තාවගේ ස්වාධිපත්‍යය ක්‍රමයෙන් පිරිහුණ ආකාරය විග්‍රහ කරන අතර බ්‍රාහ්මණ ආධිපත්‍යය තහවුරු වූ ආකාරය පෙන්වයි. කාන්තාවන් විෂයෙහි තරමක සහනශීලි ප්‍රතිපදාවකින් කටයුතු කළ ආකාරය ශ්‍රමණ චින්තනය තුළින් අනාවරණය කර ඇත. මේ අනුව පළමුවන පරිච්ඡේදයෙන් භාරතීය වනිතා සමාජය විමසුමට ලක්කොට ඇත.

බ්‍රාහ්මණ චින්තනයේ නිසරු බව, අසාධාරණ බව, ලොවට හෙළි කළ බුදු රජාණන් වහන්සේ, කාන්තාවගේ අයිතිවාසිකම් පුරුෂ පක්ෂයට සමාන වූ බව පෙන්වා දුන්හ. බ්‍රාහ්මණයින්, මනුෂ්‍යයා මහා බ්‍රහ්මන්ගේ ඒ ඒ අවයවයන් වෙතින් උපන් බව පවසන විට බුදුරජාණන් වහන්සේ පමණක් නොබියව මේ සියලූ සතුන් උපදින්නේ ස්ත්‍රී පක්ෂයෙන් බව ප්‍රකාශ කළහ. එසේ ම මාතෘත්වයේ අගය වටහා දෙමින් සතර බ්‍රහ්මවිහරණයන්ගෙන් අනූන කාන්තාව මහා බ්‍රහ්මයාට ද සම කළ ආකාරයත්, බ්‍රාහ්මණ චින්තනය ඛණ්ඩනය කළ අයුරුත් දෙවෙනි පරිච්ඡේදයෙන් සාකච්ඡා වේ.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

කාන්තාව දෙස අප්‍රසන්න ඇසින් බලා ආගමික පුද පූජාවන්ට සහභාගිවීමට තහනම් වූ එවන් යුගයක, කාන්තාව පූජනීයත්වයෙන් සැලකිය යුතු කොටසක් ලෙස සම්භාවනාවට පත් වූයේ භික්ෂුණී ශාසනයේ සම්භවයත් සමගය. කාන්තා නිදහස හා අයිතිවාසිකම් ලබා දීමට බුදුරදුන් ගත් ආදර්ශවත් මූලික පියවර මෙහෙණී සස්න පිහිටුවීම බව තුන්වෙනි පරිච්ඡේදයෙන් අවධාරණය කෙරේ.

භික්ෂුණී ශාසනය ආරම්භ වූයේ ශාක්‍යවංශික මහා ප්‍රජාපතී ගෝතමියගේ පැවිදි වීමෙනි. සමාජයේ විවිධ තරාතිරම්වලට අයත් කාන්තා පිරිස් පැවිදි වීම නිසා ක්‍රමයෙන් භික්ෂුණී ශාසනය වර්ධනය වූ ආකාරය හතර වැනි පරිච්ජේදයෙන් විස්තර වේ.

ත්‍රිපිටකාගත හා ඓතිහාසික සාධක අනුව භික්ෂුණී විනය ශික්ෂාවන්ගේ අරමුණු හා ස්වරූපය පිළිබඳ මෙහි දී අවධානය යොමුකොට ඇත. සදාචාරශීලී ශිෂ්ට සම්පන්න භික්ෂුණී පිරිසක් ඇති කරලීමට බුදුරජුන් බලාපොරොත්තු වූ බව තවදුරටත් පණවා ඇති නීති රීති විමසා බැලීම තුළින් පස්වන පරිච්ජේදයෙන් අනාවරණය වේ.

දිනෙන් දින පුළුල් වෙමින් පවතින බුද්ධිමය හා සිද්ධාන්තමය ශූන්‍යතාව හේතු කොටගෙන මිනිසා යථාර්ථය පිළිබඳ අවබෝධයෙන් බොහෝ ඈතට දුරස්ථ වී ගොස් තිබෙන වකවානුවක, ආගම් ධර්ම තුළින් සියුන්ගේ යහපත උදෙසා ම සකස් කර දී තිබෙන ඉතා සාරවත් හා ප්‍රායෝගික සංස්කෘතිය හා චින්තනය කෙරෙහි විනය ශික්ෂා වලින් අධ්‍යාපනයට ලැබෙන පිටිවහල පිළිබඳ හය වෙනි පරිච්ජේදයෙන් සාකච්ජා කෙරේ.

බුදු දහමේ ආභාසය අධ්‍යයනය කිරීම මගින් වත්මන් යුගයේ අවශ්‍යතාවන් නිරාකරණය කිරීමේ මගක් සොයාගැනීමට මිනිසාට හැකවනු ඇත. වියැකෙමින් පවත්නා සාරධර්ම ගුණයහපත්කම් යළි නගා සිටුවීමේ අරමුණින් සමාලෝචනය, නිගමනය හා යෝජනා හත්වැනි පරිච්ජේදයෙන් ඉදිරිපත් කොට ඇත.

********